# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,844/6 — 1969 මාර්තු 12 වැනි බදාදා — 1969.3.12

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

1969 අංක 85/1

අ. ආ. කා. අංක : සී. 270/65 (4)

අග්‍රාණ්ඩුකාරතුමන් විසින්, 1946 යේ හා 1947 තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥවල 49 වැනි වගන්තිය යටතේ, රාජ්‍ය කටයුතු ගරු ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්, පාර්ලිමේන්තු මන්ත්‍රී, දෙන් පීටර් අතපත්තු මහතා, 1969 මාර්තු 11 වැනි දින සිට, රාජ්‍ය කටයුතු ඇමති, පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු ජූනියස් රිචඩ් ජයවර්ධන මහතා දිවයිනට පෙරළා පැමිණෙන තුරු, රාජ්‍ය කටයුතු ඇමති වශයෙන් වැඩ බැලීමට පත් කළ බව මෙයින් දනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඒ. බී. ඇල්කඩුවේ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1969 මාර්තු 12 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.

3—692

---

## මිළ පාලන දැන්වීම්

සී. 462 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය

අතිරේක ආහාර ද්‍රව්‍ය (ධාන්‍ය ඇට වර්ග)

### මිළ පාලන පනත

#### නියෝගය

මිළ පාලක (ආහාර) තැන්පත් බුවනෙකබාහු පියන්ගේ වික්ටර් ඇලැක්සැන්ඩර් ජස්ටින් පූර්ණවන්ස සේනාරත්න වන මම, (173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියෙන් මිල පාලක (ආහාර) වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1969 පෙබරවාරි 22 වෙනි දින අංක 14,842/2 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1969 පෙබරවාරි 22 වෙනි දින අංක සී. 460 දරණ ආහාර මිළ නියෝගය මේ දන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) තවද, මීට යාකර ඇති උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් එක් එක් ද්‍රව්‍යයක් මෙරටට ගෙන්වන්නෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක්ද, තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, කොළඹ නගරයේ නාගරික සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දන් පටන් මේ උපලේඛනයේ 2 වෙනි 3 වෙනි හා 4 වෙනි තීරවල අනුපිළිවෙළින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්යය සඳහා—

(අ) උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමකට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;

(ආ) උපලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි ද්‍රව්‍යය කිසි ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මේ නියෝගයේ වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට, එකී ද්‍රව්‍යය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්යය සඳහා ''රාත්තල'' හෙවත් ''රා'', යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;
(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
(ඈ) වෙළෙඳාමේ ස්වභාවය එනම් වෙළෙඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(8) උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම්, එහි මිළත් උපලේඛනයේ 2 වෙනි හා 4 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත් වන බවද නියම කරමි.

1969 මාර්තු 12 වෙනි දින පෙ.ව. 11.30 ට කොළඹ දී අත්සන් කරන ලදී.

බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න,
මිළ පාලක (ආහාර).

## උපලේඛනය

| 1 වැනි තීරය<br>වර්ගය | 2 වැනි තීරය<br>මෙරටට ගෙන්වන්නෙකු විසින් දළ බර හොණ්ඩර යක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 3 වැනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 4 වැනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්ත ලක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| චින්තාමනි කඩල | 44 25 | 46 0 | 0 48 |
| මෑ ඇට (කව් පීස්) | 35 0 | 36 75 | 0 38 |
| කඩල පරිප්පු | — | 52 80 | 0 52 |
| මුං ඇට | 52 50 | 54 25 | 0 56 |
| උළුඳු පරිප්පු | 54 25 | 56 0 | 0 58 |
| පියලි නොකළ උළුඳු | 47 0 | 48 75 | 0 50 |
| තෝර පරිප්පු | 59 0 | 60 75 | 0 62 |
| කොණ්ඩ කඩල | 41 0 | 42 75 | 0 44 |
| චීනා වටානා පරිප්පු | 48 0 | 50 0 | 0 55 |

**සැලකිය යුතුයි.**—(1) මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකියි.

(2) මෙරටට ගෙන්වන්නකු විසින් අය කරන මිළ හොණ්ඩර 10 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකුණන විට අය කරන මිළ විය යුතුය.

3—693

---

**අංක 1969 ජී. 1 දරන ආහාර මිල ආඥාව**

අතිරේක ආහාර ද්‍රව්‍ය—ධාන්‍ය ඇටවර්ග

## මිල පාලන පනත

### ආඥාව

(173 වන අධිකාරය වන) මිල පාලන පනතේ 3 (2) වන වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ගාල්ල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිල පාලක තැන්පත් චාර්ල්ස් අබේදීර වන මම, මේ ආඥාවෙන්—

(i) 1968 සැප්තැම්බර් 17 දින අංක 14,819/6 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ 1968 සැප්තැම්බර් 12 දින අංක 1968/ජී. 5 දරණ මිල ආඥාව වහාම බල පැවැත්වෙන පරිදි අවලංගු කරමි.

(ii) මෙහිවූ උපලේඛනයේ 3 වන තීරයෙහි දක්වෙන මුදල එකතු කරන ලද (173 වන අධිකාරය වන) මිල පාලන පනත යටතේ කොළඹ මහ නගර සභා ප්‍රදේශය තුළ තොග වෙළෙන්දෙකු විසින් විකිණිය හැකි උපරිම තොග මිළ ලෙස එවකට නියම කර ඇති මිළ, ඒ උප ලේඛනයේ 1 වන තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිත ව සඳහන් ද්‍රව්‍යයේ දළ බර හොණ්ඩරයක් ඒ උපලේඛනයේ 2 වන තීරයෙහි නිශ්චිතව සඳහන් ප්‍රදේශය හෝ පරිපාලන දිස්ත්‍රික්කය තුළ විකිණිය හැකි හා එයට ඉහළින් නො විකිණිය යුතු උපරිම තොග මිළ විය යුතු ලෙස වහාම බල පැවැත්වෙන පරිදි නියම කරමි.

(iii) මෙහි වූ උපලේඛනයේ 4 වන තීරයෙහි දක්වෙන මුදල එකතු කරන ලද (173 වන අධිකාරය වන) මිළ පාලන පනත යටතේ කොළඹ මහ නගර සභා ප්‍රදේශය තුළ සිල්ලර වෙළෙන්දෙකු විසින් විකිණිය හැකි උපරිම සිල්ලර මිළ ලෙස එවකට නියම කර ඇති මිළ ඒ උප ලේඛනයේ 1 වන තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිතව සඳහන් ද්‍රව්‍යයේ ශුද්ධ බර රාත්තලක් ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් ප්‍රදේශ හෝ පරිපාලන දිස්ත්‍රික්කය තුළ විකිණිය හැකි හා එයට ඉහළින් නො විකිණිය යුතු උපරිම සිල්ලර මිළ විය යුතු ලෙස වහාම බලපැවැත්වෙන පරිදි නියම කරමි.

(iv) මෙම ආඥාවේ කාර්‍ය සඳහා—

(අ) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් ද්‍රව්‍යයක යම් ප්‍රමාණයක් නැවත විකිණීමේ කාර්‍ය සඳහා වූ යම් විකිණීමක් හෝ ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බැගින් වූ යම් විකිණීමක් තොග වශයෙන් වූ විකිණීමක් විය යුතු බවත් ;

(ආ) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස දළබර හොණ්ඩර යකට අඩු යම් ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් වූ විකිණීමක් විය යුතු බවත් ;

නියම කරමි.

(v) මෙම ආඥාවෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිම තැනැත්තෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(vi) මෙම ආඥාවෙන් උපරිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, යම් ස්ථානයක හෝ වාහනයක හෝ මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ සිය පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකු විසින් ම ඒ ද්‍රව්‍යයෙන් ප්‍රමාණවත් කොටසක් සුදුසු භාජනයක බහා එම ද්‍රව්‍ය සඳහා මෙම ආඥාවෙන් නියමිත උපරිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ සූචකයක හෝ මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධකොට එකී ද්‍රව්‍යය සහ ඒ සඳහා නියම කරන ලද උපරිම මිළ යම් ගනුදෙනුකරුවකුට පැහැදිලිව පෙනෙන සේ ඒ ස්ථානයෙහි හෝ වාහනයෙහි ප්‍රදර්ශනය කළ යුතු බව නියම කරමි.

(vii) මෙම ආඥාවේ කාර්‍ය්‍ය සඳහා " රාත්තල " හෝ " රා. " යන්නෙන් ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර සැළකිය යුතු බව නියම කරමි.

(viii) මෙම ආඥාවෙන් උපරිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තකු හා ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින් ම ගැනුම්කරු ඉල්ලුවොත්, පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;
(ආ) එම ද්‍රව්‍යයන් විකුණූ ප්‍රමාණය (බර අනුව) ;
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් විකිණීම තොග වශයෙන් ද නැතහොත් සිල්ලර වශයෙන් ද යන බව ඇතුළත් කුවිතාන්සියක් ගැනුම් කරුට දිය යුතු බව නියම කරමි.

(ix) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණූ විට, ඒ විකුණනු ලැබූ ද්‍රව්‍යය යම් දෙයක ඔතනු ලැබේ නම් නැතහොත් බහා ලනු ලැබේ නම්, එහි මිළත් ඒ උපලේඛනයේ 3 වන සහ 4 වන තීරයන්හි සඳහන් උපරිම මිළට ඇතුළත් විය යුතු බව නියම කරමි.

1969 මාර්තු 9 දින පෙ. ව. 11 ට ගාල්ලේදී අත්සන් කරන ලදී.

සී. අබේදීර,
ගාලු දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක.

## උපලේඛනය

| 1 වන තීරය<br>ද්‍රව්‍යය | 2 වැන තීරය<br>ප්‍රදේශය හෝ පරිපාලන දිස්ත්‍රික්කය | 3 වැනි තීරය<br>තොග වෙළෙන්දකු විසින් දළබර හොණ්ඩරයක් විකිණිය හැකි කොළඹ මහ නගර සභා ප්‍රදේශය සඳහා නියමිත මිළට වඩා වැඩි අධිකය<br>රු. ශ. | | 4 වැනි තීරය<br>සිල්ලර වෙළෙන්දකු විසින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි කොළඹ මහ නගර සභා ප්‍රදේශය සඳහා නියමිත මිළට වඩා වැඩි අධිකය<br>රු. ශ. |
|---|---|---|---|---|
| උළුඳු (පියලි නොකළ)<br>මුංඇට<br>තෝර පරිප්පු<br>කඩල පරිප්පු<br>චින්තාමණී කඩල<br>කොන්ඩකඩල<br>මසූර් පරිප්පු<br>මෑ ඇට (කව්පීස්)<br>උළුඳු පරිප්පු<br>චීන වටානා පරිප්පු | බෙන්තොට සුළු නගර සභා සීමාව, ඉඳුරුව ගම්සභා සීමාව, පහල ගම්හය ගම්සභා සීමාව, කොස්ගොඩ ගම්සභා සීමාව, ඌරගස්මන් හන්දිය ගම්සභා සීමාව | 2 72 | ... | 0 2 |
| උළුඳු (පියලි නොකළ)<br>මුංඇට<br>තෝර පරිප්පු<br>කඩල පරිප්පු<br>චින්තාමණී කඩල<br>කොන්ඩ කඩල<br>මසූර් පරිප්පු<br>මෑ ඇට (කව්පීස්)<br>උළුඳු පරිප්පු<br>චීන වටානා පරිප්පු | ගාල්ලේ නගරසභා සීමාව සහ කඩවත් සතර, අම්බලන්ගොඩ පළාත් ආණ්ඩු සභාව, බලපිටිය සුළු නගර සභාව, වතුගෙදර සුළු නගර සභාව, ඇල්පිටිය සුළු නගර සභාව, හික්කඩුව සුළු නගර සභාව, දෙඩන්දුව සුළු නගර සභාව, අම්බනපිනිකහන ගම්සභාව, ගොලුවා මුල්ල ඕමත්ත ගම්සභාව, කරන්දෙනිය ගම්සභාව, බටපොල ගම්සභාව, මාදම්පේ ගම්සභාව, වේරගොඩ ගම්සභාව, ගෝනපිනුවල මිටියාගොඩ ගම්සභාව, තොටගමුව-තිරනාගම ගම්සභාව, රත්ගම ගම්සභාව, බද්දේගම ගම්සභාව සහ බෝපේ ගම්සභාව | 2 86 | ... | 0 3 |
| උළුඳු (පියලි නොකළ)<br>මුං ඇට<br>තෝර පරිප්පු<br>කඩල පරිප්පු<br>චින්තාමණී කඩල<br>කොන්ඩකඩල<br>මසූර් පරිප්පු<br>මෑ ඇට (කව්පීස්)<br>උළුඳු පරිප්පු<br>චීන වටානා පරිප්පු | අහංගම සුළු නගර සභාව, අක්මීමන ගම්සභාව, හබරාදූව ගම්සභාව, කෝදගොඩ ගම්සභාව, කොට්ටාව ගම්සභාව, පොල්පාගොඩ ගම්සභාව, නාගොඩ ගම්සභාව, පෝද්දල ගම්සභාව, වඳුරඹ ගම්සභාව, තෙලිකඩමාදුවාන ගම්සභාව, වැලිවිටිය-දිවිතුර ගම්සභාව, පිටිගල-වැයිහේන ගම්සභාව, පෝද්දිවල-නියාගම ගම්සභාව සහ කතළුව ගම්සභාව, පිලාන-මැටරඹ ගම්සභාව, පරගොඩ ගම්සභාව, උඩුගම ගම්සභාව, යටලමත්ත ගම්සභාව, කහඳනාකන්ද ගම්සභාව | 3 5 | ... | 0 3 |
| උළුඳු (පියලි නොකළ)<br>මුංඇට<br>තෝර පරිප්පු<br>කඩල පරිප්පු<br>චින්තාමණී කඩල<br>කොන්ඩකඩල<br>මසූර් පරිප්පු<br>මෑ ඇට (කව්පීස්)<br>උළුඳු පරිප්පු<br>චීන වටානා පරිප්පු | හිනිදුම ගම්සභාව, ඕපාත ගම්සභාව, නෙළුව ගම්සභාව සහ දෙල්ලව ගම්සභාව | 3 11 | ... | 0 3 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු ලෙස නියම කර ඇති මිළ නොවේ. ඒවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි උපරිම මිළ වන අතර ඊට ඉහළින් ඒ ද්‍රව්‍ය නොවිකිණිය යුතුය.

3—694

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි.